# මහාමාර්ග ව්‍යාපෘති සඳහා ඉඩම් අත්කර ගැනීම හේතුවෙන් බලපෑමටලක්වන පුද්ගලයින් සඳහා වූ සහන දීමනා යෝජනාවලිය.

## 01. ඉඩම්

### 1.1 ඉඩම් සඳහා අදාලවන සහන දීමනා යෝජනාවලිය.

1.1.1 ඉඩම් සඳහා ගෙවීම් රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තීරණය කරනු ලබන පරිදි ප්‍රතිස්ථාන ගත කිරීමේ පිරිවැය පදනම් කොට ගෙන සිදු කරනු ඇත. ව්‍යවස්ථාපිත වන්දිය සහ ප්‍රතිස්ථාන ගත කිරීම් පිරිවැය අතර වෙනස කරුණා සහගත දීමනාව වශයෙන් ගෙවිය හැකිය.

1.1.2. යම් ඉඩමක් අත්කර ගැනීමෙන් අනතුරුව ඉතිරිවන කොටස (කෘෂිකාර්මික ඉඩම් හැර) වෙනමම ප්‍රවේශයක් සහිත දේපලක් ලෙස භාවිත කිරීමට නොහැකි නම්, මුලු ඉඩම සඳහා සම්පූර්ණ ගෙවීම සිදුකිරීම මගින් ඉඩමේ ඉතිරි කොටස අත්පත් කර ගැනීම / මිලදී ගැනීම පිළිබඳව ඉඩම් අත්පත් කර ගැනීමේ හා ප්‍රතිස්ථානගත කිරීමේ කමිටුවට (LARC) සළකා බැලිය හැකිය. වැඩිපුර ඉතිරිවන බිම් කැබැල්ල තබා ගැනීමට ඉඩම් අයිතිකරුවන් එකඟ වන්නේ නම්, වැඩි සැලකීමක් වශයෙන් ඔහු වෙත දීමනාවක් ගෙවීම පිළිබඳව එම කමිටුවට සලකා බැලිය හැකිය.

1.1.3. කෘෂිකාර්මික ඉඩම් සම්බන්ධයෙන් වන අවස්ථාවකදී එකී ඉඩමේ ඉතිරි කොටස භෞතික වශයෙන් වගා කටයුතු සඳහා යොදා ගැනීමට නොහැකි නම්, එම කොටස අත්පත් කර ගැනීමට හෝ ඒ සඳහා ගෙවීම් සිදු කිරීමට ලාර්ක් කමිටුව තීරණයක් ගනු ඇත. වන්දි ගෙවීම වෙළඳපොළ වටිනාකම මත සිදු නොවන අවස්ථාවකදී බහු වාර්ෂික වගාවන්හි අස්වනු නෙලීම සඳහා සාධාරණ කාල සීමාවක් ලබා දෙනු ඇත.

1.1.4. කරුණා සහගත ගෙවීම් ප්‍රධාන තක්සේරුකරු තීරණය කරනු ලබන පරිදි සිදු කරනු ඇත.

### 1.2. රජයේ ඉඩම්වල අනවසර පදිංචිය

අවශ්‍ය යැයි මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සලකන්නේ නම් පමණක් රජයේ ඉඩම්වල අනවසරයෙන් පදිංචිව සිටින්නන් ප්‍රතිස්ථාන ගත කරනු ඇත. කෙසේවුවද, ඉඩම සඳහා ගෙවීමක් සිදු නොකරනු ලබන අතර ඉඩමේ සිදුකර ඇති වැඩි දියුණු කිරීම් සඳහා ඔවුන් වෙත ගෙවීමක් සිදු කරනු ඇත. මෙම විධිවිධානය 2005.01.01 දිනට පෙර අනවසර පදිංචිය සහිත පුද්ගලයන්ට පමණක් අදාළ වනු ඇත.

### 1.3. පෞද්ගලික ඉඩම්වල අනවසර පදිංචි කරුවන්

ඉඩම් හිමිකරුවන් විසින් අධිකරණය හමුවේ නඩු පවරා නොමැති පෞද්ගලික ඉඩම්වල සිටින අනවසර පදිංචිකරුවන් හට එකී ඉඩමේ සිදු කර ඇති වැඩි දියුණු කිරීම් එම

පුද්ගලයා විසින්ම සිදුකර ඇති බවට ප්‍රමාණවත් ලෙස ඔප්පු කිරීම මත ඒ සඳහා ගෙවීමක් සිදු කරනු ඇත.

1.4. **කුඹුරු ඉඩම් අත්පත් කර ගැනීම.**

1.4.1. කුඹුරු ඉඩම් සඳහා වන කරුණා සහගත දීමනාව.

සංවර්ධන කටයුතු සඳහා කුඹුරු ඉඩම් අත්පත් කරනු ලබන අවස්ථාවන්හි දී, ඒ සඳහා කරුණා සහගත දීමනාව ගෙවනු ලබනුයේ මතු දැක්වෙන කරුණු අතර වෙනස මත පදනම්වය.

(අ) ව්‍යවස්ථාපිත වන්දිය සහ

(ආ) ඉඩම සංවර්ධනය කිරීම සඳහා අදාල බලධාරීන්ගෙන් අවසරය ලබා ගෙන ඇති බව උපකල්පනය මත ප්‍රධාන තක්සේරුකරු වි සින් ගණනය කරනු ලබන ඉඩමේ වෙළඳපල වටිනාකමෙන් 10%.

කුඹුරු ඉඩම් යනුවෙන් අදහස් කරනුයේ - වී වගා කරනු ලබන ඉඩම් හෝ වී වගා කිරීම සඳහා සුදානම් කොට ඇති ඉඩම් හෝ අත්පත් කර ගැනීමේ දිනට අවම වශයෙන් වසර 5 කාලයක් වී වගා කිරීම සඳහා භාවිත කරන ලද ඉඩම්ය.

1.5. **වීථි රේඛා හෝ ගොඩනැගිලි සීමා ඇතුළත පිහිටි ඉඩම්**

වීථි රේඛා හෝ ගොඩනැගිලි සීමා ඇතුළත පිහිටි ඉඩම් අත්පත් කරගනු ලබන්නේ නම්, වීථි රේඛා හෝ ගොඩනැගිලි සීමා පැනවූ දිනයට පසුව ඉදිකරනු ලැබූ ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සඳහා වන්දි හෝ කරුණා සහගත දීමනා නොගෙවිය යුතුය.

1.6. **මාර්ග සංවර්ධන අධිකාරිය සතු ඉඩම්වල අනවසර පදිංචිය.**

මාර්ග සංවර්ධන අධිකාරිය සතු හෝ එය වෙත පවරා ඇති ඉඩම්වල අනවසර පදිංචිය ඇති අවස්ථාවන්හි දී එකී ඉඩම්වල සිදු කර ඇති කිසිදු ඉදිකිරීමකට වන්දි හෝ කරුණා සහගත දීමනා ගෙවීමක් සිදු නොකෙරේ.

02. **ගොඩනැගිලි සහ (වෙනත් ) ඉදිකිරීම්**

ගොඩනැගිලි සහ වෙනත් ඉදිකිරීම් සඳහා ප්‍රධාන තක්සේරුකරු විසින් දී ඇති අර්ථකථනය භාවි ත කරමින් ප්‍රතිස්ථාන ගත කිරීමේ පිරිවැය (ක්ෂය කිරීමෙන් තොරව) ගෙවනු ඇත.

2.1. **කුඩා නිවාස, මඩු ආදිය** :- උපරිම ගෙවීම රු. 300,000.00 වනු ඇත.

2.2. **ඉදිකිරීම්වල කොටස් සඳහා** :- ඉදිකිරීමෙහි කොටසක් අත්පත් කර ගනු ලබන්නේ නම් ගෙවීම සඳහා බිම් ප්‍රමාණය සළකා බැලීමේ දී ඉදිකිරීමෙහි ආධාරක ස්ථාපිතව ඇති ස්ථාන දක්වා ගණනය කරනු ඇත.

2.3. **ඉදිකිරීම්වල ඉතිරිව පවත්නා කොටස්** :- ඉදිකිරීමක කොටසක් අත්පත් කර ගැනීමෙන් අනතුරුව ඉතිරිවන කොටස තවදුරටත් භාවිත කිරීමට නුසුදුසු නම් ලාර්ක් කමිටුව නිසි තීරණයක් ගනු ඇත.

2.4. **සොහොන් කොත් සහ ඒ ආකාරයේ ඉදිකිරීම්** :- එවැනි ඉදිකිරීම් ඉවත් කිරීම සහ නැවත ස්ථාන ගත කිරීම සඳහා රු. 15,000.00 ක ගෙවීමක් සිදු කරනු ඇත.

2.5. **ආගමික ඉදිකිරීම්, පොදු ගොඩනැගිලි සහ උපයෝගිතා සේවා** :- එවැනි ඉදිකිරීම් සහ පහසුකම් නැවත ඉදිකිරීම හෝ ප්‍රතිස්ථාන ගත කිරීමේ පිරිවැය ගෙවීම මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ඇත.

03. **ගෙවල් කුළී පනත යටතේ පවත්නා පරිශ්‍රයන් - සාප්පු සහ නිවාස**

ඉහත පරිශ්‍රයන් සඳහා මතු දැක්වෙන නිර්නායකයනට අනුව සහන දීමනා ගෙවනු ඇත.(ප්‍රතිස්ථාපනගත වියදම අඩු කිරීම ව්‍යවස්ථාපිත වන්දිය)

| **පදිංචි කාල සීමාව** | **ප්‍රතිශතය** | |
|---|---|---|
| | **පදිංචිකරු** | **අයිතිකරු** |
| වසර 20 ට වැඩි | 75 | 25 |
| වසර 10 - 20 | 50 | 50 |
| වසර 05 - 10 | 25 | 75 |
| වසර 05 ට අඩු | 10 | 90 |

04. **වෙළඳ ව්‍යාපාර අහිමි වීම.**

වෙළඳ ව්‍යාපාර මතු දැක්වෙන අර්ථ කථනයට අනුව වර්ගීකරණය කර ඇත.

| 4.1. | **වෙළඳ ව්‍යාපාර කාණ්ඩය** | **හිමිකම** |
|---|---|---|
| 4.1.1 | අවිධිමත් (ආදායම් බදු නොගෙවන්නන්) | අදායම ලිපිලේඛන මගින් නිශ්චය කළ හැකිනම්, රු. 15,000.00 හෝ මාස 06 ක ශුද්ධ ආදායම යන දෙකෙන් වැඩි අගය. |
| 4.1.2. | විධිමත් (ආදායම් බදු ගෙවන්නන්) | ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම අහිමිවන්නේ නම්, අවමය රු. 15,000.00 හෝ ආදායම් බදු ප්‍රකාශ ලේඛන මගින් සනාථ කළ අත්පත්කර ගැනීමට පෙර ආසන්නතම වසර 03 ක් දක්වා ශුද්ධ සාමාන්‍ය ගලපන ලද ලාභය. |

තාවකාලික බාධා සිදු වී ඇත්නම් ගෙවීම් ප්‍රමාණය ප්‍රධාන තක්සේරුකරු විසින් තීරණය කරනු ඇත.

**05. ජීවිකා වෘත්තිය අහිමි වීම.**

ස්වයං රැකියාවක නියුක්ත සහ ඉඩම් අත්පත් කර ගැනීම නිසා ආදායම අහිමි වීම මගින් තාවකාලික බලපෑමට ලක්වන්නන් රු. 15,000/- ක ජීවිකා වෘත්තිය වෙනුවෙන් ගෙවනු ලබන ප්‍රදානයකට හිමිකම් ලබයි.

**06. පහසුවෙන් පීඩාවට පත්විය හැකි පුද්ගලයන් සඳහා වන දීමනාව**

පහසුවෙන් පීඩාවට පත්විය හැකි පවුල් සඳහා රු. 15,000/- ක අමතර දීමනාවක් ගෙවනු ඇත. කාන්තාවන් විසින් නඩත්තු කරනු ලබන පවුල්, ආබාධිතයන් සහිත පවුල් සහ ඉතා වයස් ගත පුද්ගලයන් සහිත පවුල් පහසුවෙන් පීඩාවට පත්විය හැකි පවුල් වශයෙන් අදහස් කෙරේ.

**07. වැටුප් ලබන රැකියා අහිමි වීම.**

සිය සේවා ස්ථාන පිහිටි දේපළ පවරා ගැනීම හේතු කොට ගෙන තම වැටුප් ලබන රැකියාව අහිමිවන පුද්ගලයන් හට එක් පුදගලයෙකුට රු. 15,000.00 ක දීමනාවක් හෝ මාස 03 ක මූලික වැටුප යන දෙකෙන් වැඩි මුදල හිමි වේ. (ඉඩම් අත්කර ගැනීමේ පනතේ දෙවන වගන්තිය යටතේ නිවේදනය ප්‍රසිද්ධ කිරීමට පෙර මාස 06 ක සේවා කාලය තහවුරු කළ යුතුය.)

**08. අවසන් දිනයට පෙර දේපළවල සන්තකය භාර දෙන්නන් සඳහා වන කරුණා සහගත දීමනාව.**

8.1. බලපෑමට ලක්වන පුද්ගලයන් ඔවුන්ගේ දේපළවල සන්තකය මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශ කරන ලබන දිනයට ප්‍රථම භාර දෙනු ලබන්නේ නම්, මතු දැක්වෙන අමතර මූල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීමට හිමිකම ලැබේ.

| | |
|---|---|
| ගොඩනැගිලි / නිවාස | අවම රු. 25,000.00 ක් සහ උපරිම 500,000.00 කට යටත්ව ගොඩනැගිලි සඳහා වන ව්‍යවස්ථාපිත ගෙවීමෙන් 25% ක් (17 වගන්තිය) |
| වගාකරන ලද කෘෂි කාර්මික ඉඩම් | අවමය රු.10,000.00 ක් සහ උපරිමය රු.100,000.00 කට යටත්ව ව්‍යවස්ථාපිත වන්දියෙන් 5% ක් (17 වගන්තිය) |

8.2. තාවකාලික නිවාස පහසුකම්

යම් දේපලක භෞතික සන්තකය යම් නියමිත දිනයක දී පවරා ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරියට අවශ්‍යව ඇත්නම් ප්‍රතිස්ථානගත කිරීමට පෙර පදිංචිව සිටි නිවසේ බිම් ප්‍රමාණය මත පදනම්ව ගෙවිය හැකි එක් වරක් පමණක් ගෙවන ගෙවල් කුලී දීමනාව තීරණය කරනු ඇත.

| නිවාස කාණ්ඩය | මහ නගර සභා බල ප්‍රදේශ රු. | නගර සභා බල ප්‍රදේශ රු. | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ රු. |
|---|---|---|---|
| ව. අ. 500 ට අඩු | 50,000.00 | 40,000.00 | 20,000.00 |
| ව.අ. 500 - 750 | 60,000.00 | 50,000.00 | 30,000.00 |
| ව.අ. 750 - 1000 | 75,000.00 | 60,000.00 | 40,000.00 |
| 1000 ට වැඩි | 100,000.00 | 75,000.00 | 50,000.00 |

8.3. බැහැර වීමේ දීමනාව

යම් දේපලක භෞතික සන්තකය යම් නියමිත දිනයක දී පවරා ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරියට අවශ්‍යව ඇත්නම්, ප්‍රතිස්ථාන ගත කිරීමට පෙර පදිංචිව සිටි නිවසේ බිම් ප්‍රමාණය මත පදනම්ව බැහැරවීමේ දීමනාව ගෙවනු ඇත.

| නිවාස කාණ්ඩය | දීමනාව රු. |
|---|---|
| ව. අ. 500 ට අඩු | 5,000.00 |
| ව.අ. 500 - 750 | 7,500.00 |
| ව.අ. 750 - 1000 | 10,000.00 |
| 1000 ට වැඩි | 15,000.00 |

9. අනෙකුත් ප්‍රතිලාභ

9.1 සිය දේපල සඳහා ඔප්පු හිමි සෑම නැවත පදිංචි කරවනු ලබන්නකුටම තම ඉඩමේ වැඩි දියුණු නොකල වටිනාකම මත පර්චර් 20 දක්වා ප්‍රමාණයක ඉඩම කැබැල්ලක් සම්පූර්ණ පහසුකම් සහිත නැවත පදිංචි කිරීමේ භූමියකින් ලබා ගැනීමට හෝ සිය කැමැත්තෙන් ප්‍රතිස්ථානගතවනනන් හට අදාළ වන පරිදි මුදල් ප්‍රදානයකට හිමිකම ඇත.

9.2 අනවසර පදිංචිකරුවන්හට නැවත පදිංචි කරවීමේ බිමකින් පර්චස් 10 දක්වා ඉඩම් කැබැල්ලක් නොමිලේ ලබා දීම හෝ සිය කැමැත්තක් ප්‍රතිස්ථානගතවන්නන් හට අදාල වන පරිදි මුදල් ප්‍රදානයක් ලබා දෙනු ඇත.

9.3 ඉඩම් අත්කර ගැනීම් පනතේ 2වන වගන්තිය යටතේ වන නිවේදනය ප්‍රසිද්ධ කිරීමට අවම තරමින් වසර 03 කට පෙර සිට එකම හෝ වෙනම ඡන්දදායක ලැයිස්තුවක් යටතේ ලියාපදිංචිව එම නිවසේම වාසය කරන උප පවුලකට, නැවත පදිංචි කරවීමේ බිමකින් පර්චස් 10 දක්වා බිම් කොටසක් නොමිලයේ ලබා ගැනීමට හෝ අවමය රු. 100,000.00 කට යටත්ව සිය කැමැත්තෙන් ප්‍රතිස්ථානගතවන්නන්ට අදාල වන පරිදි 50% ක මුදල් ප්‍රදානයකට හිමිකම ඇත. (ඉහත ඉඩම් වල ප්‍රමාණය, අදාළ ප්‍රදේශයේ ලබා ගැනීමට ඇති ඉඩම් ප්‍රමාණය අනුව වෙනස් වනු ඇත.)

**10. සිය කැමැත්තෙන් ප්‍රතිස්ථාන ගත වීම.**

සිය කැමැත්තෙන් ප්‍රතිස්ථාන ගත වීමට කැමැති තැනැත්තන් හට ඉඩම් කැබැල්ලක් වෙනුවට නව දේපල පිහිටි ප්‍රදේශය මත පදනම්ව මතු දැක්වෙන උපරිම මුදල් ප්‍රමාණය දක්වා මුදලක් හිමිවනු ඇත. ඉහත 9.3 යටතේ ඉඩම් කැබැල්ලක් ලබා ගැනීමට හිමිකම ඇති උප පවුල් සඳහා අවමය රු. 100,000.00 කට යටත්ව ඉඩම් කැබැල්ල වෙනුවට මෙම මුදල් ප්‍රමාණයෙන් 50% ගෙවිය හැකිය.

| | | |
|---|---|---|
| 10.1 | මහනගර සභා ප්‍රදේශ | රු. 500,000.00 |
| 10.2 | මහ කොළඹ ප්‍රදේශයේ නගර සභා සහ ප්‍රාදේශීය සභා ප්‍රදේශ | රු. 300,000.00 |
| 10.3 | ප්‍රාදේශීය සභා ප්‍රදේශ | රු. 150,000.00 |

11. සියලු කරුණාසහගත දීමනා ප්‍රධාන තක්සේරුකරු විසින් තීරණය කරනු ඇත. කිසිදු කරුණා සහගත දීමනාවක් සඳහා පොලියක් ගෙවිය නොහැකිය. ගෙවීම්වල ප්‍රමාණ සම්බන්ධයෙන් වන ගැටලු පිළිබඳව හැර පරිපාලන ගැටලු සහ ඉඩම් අත්පත් කර ගැනීමේ දී පැනනගිනු ලබන අනෙකුත් කරුණු හා සම්බන්ධ ආරවුල් පිළිබඳව ලාර්ක් කමිටුව තීරණ ගනු ඇත.

**12. හිමිකම් ලබන බලපෑමට පත් වූ පුද්ගලයන්**

අමාත්‍ය මණ්ඩලය විසින් 2001.10.03 දින අනුමත කරන ලද (අමාත්‍ය මණ්ඩල සංදේශ අංක.01/1778/017/002) දැනට පවත්නා සහන යෝජනාවලිය මගින් ආවරණය වන ව්‍යාපෘති හෝ මෙම යෝජනා ක්‍රමය හඳුන්වාදීමට පෙර අත්පත් කර ගනු ලැබූ ඉඩම් සඳහා මෙම යෝජනාවලිය අදාල නොවේ.